# ජඩමාධ්‍ය

අප ජඩමාධ්‍ය ගැන සඳහන් කරන්නේ දැන් කලක සිට ය. විවිධ වර්ගවල ජඩමාධ්‍ය වෙයි. එලෙස ම විවිධ ජඩමාධ්‍යවේදීහු ද වෙති. එහෙත් ජඩමාධ්‍ය යන්න ද සාපේක්ෂ වූවකි. මට ජඩමාධ්‍යයක් වන පුවත්පතක් ගුවන්විදුලි නාලිකාවක් හෝ රූපවාහිනී නාලිකාවක් හෝ තවත් අයකුට ප්‍රබුද්ධ මාධ්‍යයක් විය හැකි ය. එවැනි සාපේක්ෂ බවක් නොපිළිගන්නෝ ඊනියා යථාර්ථවාදීහු වෙති. ජඩමාධ්‍ය මෙන් ම යථාර්ථවාදීහු ද විවිධ වර්ගවලට අයත් වෙති. සාහිත්‍යයේ ද, දේශපාලනයේ ද, දර්ශනයේ ද වෙනත් ක්ෂෙත්‍රවල ද කසිකබල් යථාර්ථවාදීහු වෙති.

එහෙත් අප මෙහි දී මූලික වශයෙන් සාකච්ඡා කරන්නේ යථාර්ථවාදීන් ගැන නොව ජඩමාධ්‍ය ගැන ය. ඇතැම් ජනමාධ්‍ය යම් දේශපාලන මතවාදයක් වෙනුවෙන් විවිධ දෑ පළකරයි. ජනමාධ්‍යයේ ඉතා ප්‍රසිද්ධ ප්‍රකාශයකට අනුව ජනමාධ්‍ය විසින් කෙරෙන්නේ පුවත් වාර්තා කිරීම පමණකි. ඒ විවරණය කිරීම ජනමාධ්‍යයෙහි නොව වෙනත් අයගේ කාර්යයකි. මේ ප්‍රකාශය ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් ප්‍රචාරය කෙරෙන ජනතාව මුළාකිරීමට යොදාගන්නා තවත් පට්ටපල් බොරුවක් පමණකි. මේ ප්‍රකාශය සත්‍යවීමට නම් ජනමාධ්‍යකරුවන් මළවුන් විය යුතු ය. ඇතැම් ජනමාධ්‍යකරුවන් තම ආත්මය (බෞද්ධ අර්ථයකින් නො වේ) විකුණා ඇති බැවින් ඔවුන් ජීවත්වන්නේ මළවුන් මෙනි. එහෙත් අප මෙහි දී සඳහන් කරන්නේ එවැන්නන් ගැන නො වේ.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය තරම් ජනතාව මුළාකරන තවත් සමාජයීය මාතයක් ලොවෙහි තිබි නැත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම් ආදී විවිධ සංකල්පවල ඇත්තේ අපට කියා දෙන අර්ථය නො වේ. ඩෙරීඩා වැනි පඬිවරුන්ට ඊනියා විසංයෝජනයක් හඳුන්වාදීමට සිදු වී ඇත්තේ ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි බොහෝ දෑ සඟවන බැවිනි; එසේත් නැත්නම් උපකල්පනය කෙරෙන බැවිනි. ඒ ඊනියා පශ්චාත්නූතනත්වයක් නොව නූතනත්වයේ ම විකාශයකි. ජනමාධ්‍ය සම්බන්ධයෙන් ද තත්වය එසේම ය. පුවත් වාර්තාකිරීමෙහි පමණක් නිරතවන ජනමාධ්‍යවේදීහු ලොවෙහි කිසිම තැනක නො වෙති. එයට හේතුව ඉතා පැහැදිලි ය. කිසිම ජනමාධ්‍යවේදියකුට පුවත් වාර්තාකිරීමෙහි පමණක් නිරත විය නො හැකි ය. විවරණයක් නැතිව පුවත් ඉදිරිපත් කළ හැකි බව කියැවෙන්නේ ජනමාධ්‍යවේදය උගන්වන පංතිවල දී පමණ ය.

ඕනෑම පුවතක යම් විවරණයක් වෙයි. ජනමාධ්‍යවේදියා මිය ගොස් නැත්නම් ඔහු ගේ විවරණය ඔහු ඒ ගැන නොසිතාම පුවතට එකතු වෙයි. ලෝකයේ ඉහළ ම අපක්ෂපාත ජනමාධ්‍යයක් ලෙස අපට කියා දෙන, එවැනි මතයක් අපට විශ්වාස කිරීමට බලකරන, බීබීසියේ ජඩ පක්ෂපාති බව අද බොහෝ දෙනා දනිති. එකල අපට බීබීසියේ අපක්ෂපාත බව පිළිබඳ බයිලා කී ඇතැම්හු දැන් අපට බීබීසියේ නිරුවත පෙන්වා දෙති. ඒ හොඳ ලක්ෂණයකි. අද ඇතැමුන් කොටින්ට විරුද්ධව යුද්ධ කිරීම පිළිබඳ අපට ම කියා දීම ද යහපත් ප්‍රවණතාවකි.

ජනමාධ්‍යවේදියෙක් යනු යන්ත්‍රයක් නො වේ. ඔහුට ද යම් සංස්කෘතියක්, ඉතිහාසයක්, චින්තනයක් වෙයි. ඒ හැරෙන්නට ඇතැමුනට රැකගත යුතු රැකියාවක් වෙයි. ජනමාධ්‍යවේදියා පුවත් වාර්තාකරන්නේ එවැනි පසුබිමක ය. ඔහු පුවතක් දකියි. එසේත් නැත්නම් ඒ ගැන අසයි. ඔහුට පෙනෙන පුවත සියළු ජනමාධ්‍යවේදීන්ට එකම ආකාරයකට පෙනෙන්නේ යැයි සිතන්නේ ද? අප ලෝකය බලන්නේ අපට පෙනෙන ආකාරයට ය. අපට ලෝකය පෙනෙන්නේ අප බලන ආකාරයට ය. ජනමාධ්‍යවේදියා ඉන් මිදුනෙක් නො වෙයි.

දෙදෙනෙක් එකම පුවතක් වාර්තා නො කරති. අප සිතා සිටින්නේ ජනමාධ්‍යවේදීන් දෙදෙනකු එකම පුවත දෙයාකාරයකට වාර්තා කරන බව ය. එහෙත් ඒ එසේ නො වේ. ජනමාධ්‍යවේදීහු පුවත් නිර්මාණය කරති. අපි සියළු දෙනා ම පුවත් නිර්මාණය කරමු. අපි පුවත් පමණක් නොව සෑම දෙයක් ම නිර්මාණය කරමු. පුවතක් ඒ ඒ ජනමාධ්‍යවේදියාට ඒ ඒ ආකාරයෙන් ගෝචර වන්නේ යැයි යන්න වැරදි ව්‍යවහාරයකි. ඒ ඒ ජනමාධ්‍යවේදියා ඒ ඒ පුවත නිර්මාණය කරයි. වැඩි විස්තර සඳහා මගේ ලෝකය කියවන්න.
ආණ්ඩුවේ ජනමාධ්‍ය හා සිරසක් නැති ජනමාධ්‍ය අධ්‍යයනය කිරීමෙන් ජනමාධ්‍ය පුවත් නිර්මාණය කරන ආකාරය අධ්‍යයනය කළ හැකි ය. එමෙන් ම සතිඅන්ත කසිකබල් පුවත්පතක සේවය කරන පිරිසක් දෙමළ ජාතිවාදයට කිසිම

© Prof. Nalin De Silva

සංගත බවක් නැතිව ආවඩන ආකාරය ද දැනගත හැකි ය. තමන් ප්‍රබුද්ධයන් යැයි සිතන මේ පිරිස තමන් ඊනියා යථාර්ථයක් හෝ යථයක් ගැන කතාකරන්නේ  යම් මතවාදයක් මත පදනම් වී බව තේරුම් නොගනිති. ප්‍රබුද්ධයන්ට තේරුම් ගැනීම අපහසු වන්නේ ඔවුන් තම මතවාදය එකම සත්‍යය යැයි විශ්වාස කරන බැවිනි. මොවුන්ගෙන් ඇතැම්හු මාක්ස්වාදීහු වෙති. මාක්ස්වාදීහු තවමත් දහනවවැනි සියවසේ ජීවත් වෙති. තවත් සමහරු පශ්චාත්නූතනවාදීහු වෙති. ඔවුන් ජීවත්වන්නේ ඊනියා මනෝවිශ්ලේෂකයන්ගේ ගුබ්බෑයම්වල ය.

මොවුන් සියළු දෙනා ම ලෝකය දකින්නේ තම තමන්ගේ මතවාදවල පදනම් වෙමිනි. මෙයට අමතර ව සිරසක් නැති ජනමාධ්‍ය හා බොරුවට දෙදරණ ජනමාධ්‍ය වෙයි. මොවුන් සියළු දෙනාට ම පොදු මතවාදයක් වෙයි. ඒ සිංහල බෞද්ධ විරෝධී වෙයි. මාක්ස්වාදියෝ ද, පශ්චාත් මාක්ස්වාදියෝ ද, පශ්චාත්නූතනවාදීහු ද, සිරසක් නැත්තෝ ද, බොරුවට දෙදරන්නෝ ද, රත්තරන් භාණ්ඩ කරුවෝ ද ආදී සියල්ලෝ සිංහල බෞද්ධ විරෝධි වීමේ දී එක්වෙති. ඇතැම්හු බොරුවට සිංහල වංශය ගැන කතාකරති. එහෙත් ඔවුන්ට අවශ්‍ය සිංහල බෞද්ධකමට පහරදීම බව දැන් දැන් සිංහල බෞද්ධයෝ තේරුම් ගනිමින් සිටිති. ඔවුහු සියල්ලෝ ම මහාවිහාරයට විරුද්ධ වෙති. සිංහල බෞද්ධ කමට පක්ෂපාතී ද නැත් ද යන්න මැනෙන්නේ මහාවිහාරයෙනි. සිංහල බෞද්ධකමේ උරගල මහාවිහාරය මිස අපේ ගම ගැන රූපවාහිනී නාලිකාවල බොරු දොඩන වාචාලයන්ගෙන් ලබාගන්නා සහතික නො වෙයි.

සංගත නොවීම මේ සියළු ජඩමාධ්‍යකරුවන්ගේ ලක්ෂණයක් වෙයි. මොවුන්ට තවමත් ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය පටන්ගැනෙන්නේ පනස්හයෙන් පසුව ය. එසේත් නැත්නම් පුරවැසි පණතින් පසුව ය. එහෙත් මොවුහු කිසිම චකිතයක් නැතිව ඉලංකෙයි අරසු කච්චි හෙවත් ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය ඇරඹුණේ පනස්හයට බොහෝ කලකට පෙර බවත් ජී. ජී. පොන්නම්බලම් පනහට පනහ ඉල්ලා සිටියේ පුරවැසි පණතට පෙර බවත් අමතක කරති. ඕනෑම අයකුට පුවත් නිර්මාණය කළ හැකි ය. එහෙත් ඒ සංගත ව කළ යුතු ය.

ජඩමාධ්‍යකරුවන් සංගත ව පුවත් නිර්මාණය නොකරනවා පමණක් නො වේ. ඔවුහු රටේ ස්වාධිනත්වයට එරෙහි ව පුවත් නිර්මාණය කරති. ඔවුන්ට අවශ්‍ය වන්නේ රට අස්ථාවර කිරීම ය. තම දෙමළ ජාතිවාදී මතවාදය හේතුකොටගෙන ඇතැම් ජඩමාධ්‍යවේදීහු කොටින්ට එරෙහිව කරන මෙහෙයුම් අසාර්ථක වන තුරු බලා සිටිති. කොටි බෝම්බවලින් රට විනාශ වීම අපේක්ෂා කරති. එසේ විනාශ නොවන්නේ නම් ජඩමාධ්‍ය තමන් ම මැදිහත් වී රට විනාශ කිරීමට උත්සාහ කරති. ඒ ජනතාව උසිගැන්වීමට උත්සාහ කිරීමෙනි. එහි දී ඔවුන් යොදාගන්නේ තුට්ටු දෙකේ උපක්‍රම ය. එයින් ම ඔවුන්ගේ ඊනියා නිර්මාණශීලීත්වය හෙළිදරවු වෙයි.

කොටි බෝම්බවලින් මිනිසුන් මියගොස් නැත්නම් මේ ජඩමාධ්‍ය පෙර දිනක බෝම්බවලින් මියගිය අයගේ ඡායාරූප ප්‍රචාරය කරයි. එමගින් හැකිනම් ආණ්ඩුව අප්‍රසාදයට පත්කිරීමට වෙර දරයි. මේ ජඩමාධ්‍යවල අරමුණ අන්කිසිවක් නොව හැකිනම් ආණ්ඩුව පළවාහැර කොටින්ට විරුද්ධ මෙහෙයුම් නැවැත්වීම ය. කොටි කිලිනොච්චියේ කොටු වී සිටින මේ මොහොතේ ජඩමාධ්‍ය ක්‍රියා කරන්නේ මේ තම අවසාන අවස්ථාව බව දැනගනිමිනි. අද කොටි පමණක් නොව ජඩමාධ්‍ය ද ආණ්ඩුවට එරෙහි ව පහර දෙයි.

ඊනියා ජනමාධ්‍ය නිදහසක නාමයෙන් ගණිකා වෘත්තියෙහි යෙදෙන ජඩමාධ්‍ය සම්බන්ධයෙන් කළ යුත්තේ කුමක් ද? ජඩමාධ්‍ය අද රටේ ස්වෛරිභාවයට තර්ජනයකි. ජඩමාධ්‍ය රට අස්ථාවරභාවයකට තල්ලුකර දැමීමට උත්සාහ දරයි. එසේ වුවත් ඇතැම්හු තවමත් ජඩමාධ්‍ය නරඹති. එයට සවන් දෙති. ඒ කියවති. ඔවුන් එසේ කරන්නේ ඇයි?  බීබීසී අගුපිලේ සිට ප්‍රචාරය කෙරෙන දෙමළ ජාතිවාදී සංදේශයට දැන් පෙර තරම් පිරිසක් සවන් නොදෙන නමුත් ඒ විකාශය කිරීමට ගුවන් විදුලි සංස්ථාව මෙතරම් වලිකන්නේ ඇයි. එයට හේතුව ගිවිසුමක් තිබීම ද? එහෙත් ඉතිහාසයේ ගිවිසුම් කැඩීමේ පාඩම අපට ඉගැන්වූවෝ සුද්දෝ ම වෙති. ආණ්ඩුව ජඩමාධ්‍ය සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු ය. ජඩමාධ්‍යයට ජනමතය සකස්කිරීමට නො හැකි ය. ඒ බව පළාත්සභා මැතිවරණයේ දී ද තහවුරු විය. එහෙත් ජඩමාධ්‍යයට ඇතැම් විටක මුළු රටට ම ගිනි තැබිය හැකි බව ආණ්ඩුව තේරුම් ගත යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva